# බළන්ගොඩ නගර සභාව

## 2021-12-06 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.12.06**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |

**නිලධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. අද දින පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය, පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය, බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම හා බළන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 යන ක්ෂේත්‍රයන් සඳහා අවම ලංසු මුදල හා තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ තීරණයක් ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පැවසීය.

ඒ පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

අදාල සාකච්ඡාවෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ඒ අනුව කාරක සභාවේ දී ගන්නා ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා රජයේ තක්සේරු මුදල වන රු. 10,000.00 ක මුදල අවම මාසික ලංසු මුදල වශයෙන් තීරණය කර, ටෙන්ඩර් කිරීම
- පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සඳහා රජයේ තක්සේරු මුදල වන රු. 400,000.00 ක මුදල අවම මාසික ලංසු මුදල වශයෙන් තීරණය කර ටෙන්ඩර් කිරීම හා දිවයිනේ ඕනෑම ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් ලබා ගත හැකි වුව ද රත්නපුර දිස්ත්‍රික්කයේ අවසර ලත් මස් මඩුවකින් පමණක් මස් ලබා ගැනීම
- බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු සඳහා අවම මාසික ලංසු මුදල වශයෙන් රු. 95,000.00 ක් තීරණය කිරීම
- බළන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 සඳහා අවම මාසික ලංසු මුදල වශයෙන් රු. 22,500.00 ක් තීරණය කිරීම

යන තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**පෙ.ව 11.01 ට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 11.04 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.